රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:-06/2010

මගේ අංකය:- එච්ජ්ඩීඅයිඑස් 13 වෙසක්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2010.05.06 දින,

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**ශ්‍රී බුද්ධ වර්ෂ 2554 වෙසක් උත්සවය සැමරීම.**

ශ්‍රී බුද්ධ වර්ෂ 2554 ක් වූ 2010 වර්ෂයේ මැයි මස 27 හා 28 දෙදින වෙසක් දින වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

02. එබැවින්, 2010 මැයි මස 27 හා 28 දිනයන්හි දී රජයේ සියළුම ගොඩනැගිලිවල බෞද්ධ කොඩිය ඔසවා තැබීමට සහ එම ගොඩනැගිලි විදුලි ආලෝක කිරීමට ද, "සුසද්ජිට බුද්ධ සාසනෙ" (බුදු සසුනේ පිළිවෙත් පුරන්න) යන පාලි පාඨය සහ "2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තියට පිළිවෙතින් පෙළ ගැසෙමු" යන සිංහල පාඨය ද එකම බැනරයක සකසා රජයේ ආයතනයන් සහ කාර්යාලයන් ඉදිරිපිට ප්‍රදර්ශනය කිරීමට ද තීරණය කර තිබේ.

03. ඒ අනුව කටයුතු කරන ලෙස ඔබ යටතේ ඇති සියළුම ආයතන වලට දන්වන මෙන් කාරුණිකව දන්වමි.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශය